**මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ**
**කළමණාකරණ සහකාර තාක්ෂණ නොවන බණ්ඩ 2 සේවා ගණයේ නිවාස මාතා තනතුරේ III ශ්‍රේණිය**
**සඳහා තෝරා ගැනීමට අදාල අයදුම්පත් කැඳවීම.(විවෘත)**

මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ නොවන බණ්ඩ 2 සේවා ගණයේ නිවාස මාතා තනතුරේ iii ශ්‍රේණිය සඳහා පත් කර ගැනීමට සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026.10.02 වේ.

02. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.05.28 දිනැතිව අනුමත කරන ලද මධ්‍යම පළාත් සමාජ සුභසාධන, පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහාකාර තාක්ෂණික නොවන - බණ්ඩ 2 සේවා ගණයේ බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ විධිවිධාන අනුව 2026.01.27 දිනට සුදුසුකම් සම්පූර්ණ කර ඇති **කාන්තා අයදුම්කරුවන්ට** මේ සඳහා අයදුම් කල හැකිය.

03. තනතුරු 04 ක් සඳහා අයදුම්පත් කැඳවන අතර මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ.රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 ට අනුව මෙම තනතුරට අදාල වැටුප් කේතය හා පරිමාණය පහත පරිදි වේ.
MN 01 – 2025, 45230 – 10 X 540 – 11 X 630 – 10 X 890 – 10 X 1190-78360/=

(i) අධ්‍යාපන සුදුසුකම් - සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් (02) දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් (06) හයකින් අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත්ව තිබීම සහ අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයේදී අවම වශයෙන් විෂයන් එකක්වත් (සාමාන්‍යය පොදු පරික්ෂණය හා ඉංග්‍රීසි හැර) සමත්වී තිබීම.

(ii) උපරිම හා අවම වයස් සීමා - 2026.01.27 දිනට වයස අවුරුදු 18ත් 30ත් අතර විය යුතුය. දැනට රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් උපරිම වයස් සීමාව අදාල නොවේ.

(iii) වෘත්තීය සුදුසුකම් - ශ්‍රී ලංකා සමාජ සේවා විද්‍යාලය, තෘතීය හා වෘත්තීය කොමිෂන් සභාව පිලිගත් ආයතනයක්, හෝ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයකින් නිකුත් කරනු ලබන ළමයින් හා යෞවනයන් රැකබලාගැනීම පිළිබඳ එක් අවුරුදු පාඨමාලාවක් හදාරා තිබීම.

(iv) පළපුරුද්ද - අදාල නොවේ.

(v) කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(vi) වෙනත් -

i. ශ්‍රී ලාංකාවේ පුරවැසියකු විය යුතුය

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. පූර්වාසන්න වසර 3 ක කාලය තුළ මධ්‍යම පළාත් සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිය ඇති පුරවැසියෙකු විය යුතුය.

iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් , එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය

.

03. බඳවා ගැනීමේ ක්‍රමය - (i) මධ්‍යම පළාත් සමාජ සුබසාධන පරිවාස සහ ළමාරක්ෂක සේවා විෂයභාර අමාත්‍යංශ ලේකම් විසින් පවත්වනු ලබන ලිඛිත විභාගය සමත්වන වැඩිම ලකුණු ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් බඳවාගැනීමට අපේක්ෂිත සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට භාජනය කර කායික යෝග්‍යතාවය හා සුදුසුකම් පරීක්ෂාකර බඳවාගනු ලැබේ.

(ii) ලිඛිත විභාගය -

| විෂයයන් | විෂය නිර්දේශය | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 01.අභියෝග්‍යතා පරීක්ෂණය | අපේක්ෂකයාගේ භාෂාමය හා සංඛ්‍යාමය හැකියාවන් පරීක්ෂා කිරීම සඳහා සකස් කරනු ලබන ප්‍රශ්න පත්‍රයකි. | 100 | 40 |
| 02.සාමාන්‍ය දැනීම | ජාතික හා ජාත්‍යන්තර, සමාජ ආර්ථික, දේශපාලන හා කාලීන තොරතුරු ඇතුලත් ප්‍රශ්න පත්‍රයකි. | 100 | 40 |

(ii) අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - දැන්වීමේ පලකර ඇති අයදුම්පතේ ආකෘතියට අනුව සකස් කරගත් අයදුම්පතක් සම්පූර්ණ කර 2026.10.02 දින හෝ එදිනට පෙර ලේකම්, තැ.පෙ 121, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යංශය, සංඝරාජ මාවත මහනුවර ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් යොමුකල යුතුය.අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "මධ්‍යම පළාත් පරිවාස සහ ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ අනුමත කළමණාකරණ සහකාර තාක්ෂණ නොවන බණ්ඩ 2 සේවා ගණයේ නිවාස මාතා III ශ්‍රේණිය සඳහා තෝරා ගැනීමට අදාල අයදුම්පත් කැඳවීම" ලෙස සඳහන් කල යුතුය.

දිනය 2026.09.11

ජගත් අධිකාරි
ලේකම්
සෞඛ්‍ය දේශීය වෛද්‍ය සමාජ සුභසාධන
පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ අමාත්‍යංශය
මධ්‍යම පළාත